**සීමා සහිත ලංකා පොහොර සමාගම - 2021/ 2022**

**----------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

සීමා සහිත ලංකා පොහොර සමාගමේ ("සමාගම") 2022 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙමෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.
හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 1 හි 69 වගන්තිය ප්‍රකාරව වර්ෂයක කාලසීමාව ඉක්මවූ සියලුම වගකීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ ජංගම නොවන වගකීම් යටතේ දැක්විය යුතු වුවත්, පොහොර ආනයනය සඳහා වූ ණයවර ලිපි 17 කට අදාළව ගෙවිය යුතු රු.3,377,769,725 ක වටිනාකමකින් යුත් වර්ෂයක කාලසීමාව ඉක්මවූ ණය වටිනාකම ජංගම වගකීම් යටතේ දක්වා තිබුණි. | එකඟ වේ.<br>2023 වර්ෂයේදී මෙම කෙටිකාලීන ණය වලින් අනෙකුත් බෝග සඳහා වන ණය ප්‍රතිව්‍යුහගත කරන ලද අතර ඉතිරිය කාලීන ණය ගිණුමකට පරිවර්තනය කරන ලදී. ඒ අනුව 2023 වර්ෂයේදී අදාළ ගැළපීම් සිදු කර ඇත. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව ජංගම වගකීම් හා ජංගම නොවන වගකීම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී දේශීය පොහොර මිලදී ගැනුම් සිදු වී නොමැති බවට මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණද දේශීය පොහොර මිලදී ගැනුම් වෙනුවෙන් දරන ලද රු.103,099,679 ක් පොහොර ආනයන බිල්පත් වටිනාකම තුළ ඇතුළත් කර තිබුණි. ඒ අනුව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 1 හි 45 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන අයිතම පෙර වර්ෂයට අනුරූපීව ඉදිරිපත් කිරීම හා වර්ගීකරණය කළයුතු වුවද, දේශීය හා ආනයනික පොහොර මිලදී ගැනීම් පෙර වර්ෂයන්ට අනුරූපීව මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව්කර නොමැති බව නිරීක්ෂණය විය. | එකඟ වේ.<br>දේශීය කාබනික පොහොර මිලදී ගැනීම් වල වටිනාකම වූ රු.103,099,679 ක් විකුණුම් පිරිවැය යටතේ ආනයන බිල්පත් වටිනාකම යටතේ වැරදීමකින් පෙන්නුම් කර ඇත. නමුත් දේශීය මිලදී ගැනීම් යටතේ අදාළ කාබනික පොහොර මිලදී ගැනීම් පෙන්නුම් කළ යුතු වේ. එය සමාලෝචිත වර්ෂය තුළදී නිවැරදි කිරීම් කරනු ඇත. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව පෙර වර්ෂයට අනුරූපීව මූල්‍ය ප්‍රකාශන අයිතම ඉදිරිපත් කිරීම හා වර්ගීකරණය කිරීම කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රවාහන හා හැසිරවීමේ වියදම් සඳහා වූ අවසාන ඉන්වොයිස් පත්‍ර පියවීමට පෙර 2020/2021 මූල්‍ය වර්ෂය තුළදී පෞද්ගලික සැපයුම්කරුවකුට අතුරු ගෙවීම් ලෙස රු.13,000,000 ක් ලබාදී තිබුණු අතර අවසාන ගෙවීම් වවුචරයේ වටිනාකම රු.21,892,044 කි. මෙම ගනුදෙනුව ගිණුම් තැබීමේදී උක්ත අතුරු ගෙවීම වියදම් ගිණුමට හර නොකිරීම හා ඉතිරි වියදම, අදාළ වියදම් ගිණුමට හර නොකොට වෙනත් ණයහිමි ගිණුමට හර කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ප්‍රවාහන හා හැසිරවීමේ වියදම් රු.21,892,044 කින් හා වෙනත් ණයහිමි ගිණුමේ ශේෂය රු.8,891,994 කින් අඩුවෙන් දක්වා තිබුණු අතර ජංගම වත්කම් යටතේ වන අත්තිකාරම් ගිණුමේ ශේෂය රු.13,000,000 කින් | එකඟ වේ.<br>ප්‍රවාහන හා හැසිරවීමේ වියදම් දැරීම වෙනුවෙන් 2020/21 වර්ෂය වෙනුවෙන් දරන ලද රු.9,000,000 ක් සහ රු.4,000,000 ක් එකතුව රු.13,000,000 ක මුදල පමණක් මෙම වර්ෂයේ ගිණුම් වලින් ගැළපීම් කළ යුතුව ඇත. ඒ සඳහා අදාළ ගැළපීම් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. විගණන විමසුමේ සඳහන් පරිදි සමාලෝචිත වර්ෂය තුළ ලාභය රු.21,892,044 ක අධි තක්සේරුවක් වශයෙන් සඳහන් වුවද එහි නිවැරදි අගය වන්නේ රු.12,500,000 ක් පමණි. | වර්ෂයට අදාළ වියදම් නිසි පරිදි හඳුනාගෙන ලෙජර් ගිණුම් තුළ නිවැරදි ගැළපීම් සිදුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වැඩියෙන් දක්වා තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ ලාභය රු.21,892,044 කින් අධිගණනය වී තිබුණි. | | |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ සෞඛ්‍ය රක්ෂණ වාරිකය, සේවක වන්දි රක්ෂණ වාරිකය, ගිනි රක්ෂණ වාරිකය හා මාර්ගස්ථ හා සේප්පුගත මුදල් රක්ෂණ වාරිකය සඳහා පිළිවෙලින් රු.10,469,271, රු.171,225, රු.572,730 හා රු.47,054 ක් වශයෙන් එකතුව වටිනාකම රු.11,260,280 ක වියදමක් දරා ඇති අතර එම වියදමෙන් ඉදිරි වර්ෂයට අදාළ වටිනාකම වන රු.3,692,175ක ප්‍රමාණය ඉදිරියට කළ ගෙවීමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. තවද, පෙර වර්ෂයේ ඉදිරියට කළ රක්ෂණ වාරික වියදම් ගිණුමේ ශේෂය වන රු.3,966,559 ක් සමාලෝචිත වර්ෂයේ රක්ෂණ වාරික වියදමට ගැළපීම් නොකොට මූල්‍ය ප්‍රකාශන තුළ ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ ලාභය සහ ජංගම වත්කම්හි වටිනාකම රු.274,384කින් අධිගණනයවී ඇති බවට නිරීක්ෂණය විය. | එකඟ වේ.<br>සමාලෝචිත වර්ෂයේ රක්ෂණ වාරිකය වශයෙන් එකතුව රු.11,277,256 ක වියදමක් දරා ඇති අතර ඉදිරි වර්ෂය සඳහා ගෙවීම් කොට ඇති රක්ෂණ වටිනාකම රු.3,696,758 කි. එය සමාලෝචිත වර්ෂය තුළදී අදාළ ගැළපීම් සිදුකොට නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. | වර්ෂයට අදාළ වියදම් නිසි පරිදි හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | බහාලුම් කාර්යාල ඉදිකිරීම හා අලුත්වැඩියා සේවාවන් සපයන ලද කොන්ත්‍රාත්කරුවන් පස්දෙනෙකුගේ 2022 මාර්තු 31 දින වනවිට මාස 06 ඉක්මවා ඇති එහෙත් ඉල්ලීම් නොලද එකතු වටිනාකම වූ රු.371,403 ක රඳවුම් මුදල් අදාළ පාර්ශවයන්ගෙන් විමසා නිරවුල් නොකර ගෙවිය යුතු ශේෂයක් ලෙස දක්වා තිබුණි. | එකඟ නොවේ.<br>2022.03.31 දින වන විට වසරක් ඉක්මවා නොමැති හෙයින් ආපසු ඉල්ලුම් කළහොත් ගෙවීම් කිරීම සඳහා ගිණුම් වල සටහන්ව තිබිය යුතු හෙයින් සාධාරණ කාල පරිච්ඡේදයක් දක්වා ගිණුම් වල සටහන් කර තිබිය යුතු වේ. | ඉකුත් තැන්පතු අදාළ පාර්ශවයන් විමසා නිරවුල් කිරීමට සහ හිමිකම් නොපාන්නේ නම් ආදායමට බැර කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | බහාලුම් කාර්යාල සඳහා වූ වාර්ෂික ක්ෂය ප්‍රමාණය රු.516,689 ක් වන අතර බහාලුම් කාර්යාල ක්ෂය ලෙස වර්ෂය තුළ ගිණුම්ගතකර ඇත්තේ රු.274,290 ක් පමණි. ඒ අනුව ජංගම නොවන වත්කම් හා වර්ෂයේ ලාභය රු.242,399 කින් අධිගණනය වී ඇති බව නිරීක්ෂණය විය. | එකඟ වේ.<br>සමාලෝචිත වර්ෂය තුළදී අදාළ ගැළපීම් සිදු කොට නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. | සමාගමෙහි ක්ෂය ප්‍රතිපත්තියට අනුකූලව වාර්ෂික ක්ෂය ගණනය හා ගිණුම්ගත කිරීම කළ යුතුය. |
| (ඉ) | 2020/2021 මූල්‍ය වර්ෂයේදී ලැබිය යුතු ආදායමක් ලෙස ගිණුම්ගත කරන ලද රු.542,000 ක අධික වාරික ආදායම් වටිනාකමට අදාළව ප්‍රවර්තන වර්ෂයේදී මුදල් ලැබී ඇති අතර එය ණයගැති ගිණුමට බැර කිරීම වෙනුවට ප්‍රවර්තන වර්ෂයේ අධික වාරික ආදායම් ගිණුමට බැර කිරීම හේතුවෙන් | එකඟ වේ.<br>2021/22 ගිණුම් වර්ෂය තුළ මෙම ගිණුම් සංකේත වැරදියට සටහන් වීමේ දෝෂය හඳුනාගෙන JV/BK/2022-23/16 මගින් නිවැරදිකොට 2023.03.31 දින ගිණුමට ගැළපීම් සිදු කර ඇත. | ලැබිය යුතු ආදායම් නිසි පරිදි හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ජංගම වත්කම් හා වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් අධිතක්සේරුවී ඇති බව නිරීක්ෂණය විය. | | |
| (ඊ) | සමාගමේ ගබඩාවන් සඳහා ගිවිසුම් ප්‍රකාරව ගබඩා සේවකයින් සැපයීමට අපොහොසත් වීම හේතුවෙන් මිනිස්බල සැපයුම් හා උපදේශන සේවා සපයන පෞද්ගලික ආයතනයක් වෙතින් ලබා ගෙන තිබුණු රු.362,500 ක ලංසු ඇපකර ආදායම් ලෙස ගිණුම් ගත කිරීම වෙනුවට තවදුරටත් ජංගම වගකීමක් ලෙස දක්වා තිබුණි. | එකඟ වේ.<br>2022/23 ගිණුම් වර්ෂය තුළ මෙම ගිණුම් සංකේත වැරදියට සටහන් වීමේ දෝෂය හඳුනාගෙන JV/BK/2022-23/46 මගින් නිවැරදි කොට 2022.03.31 දින ගිණුමට ගැළපීම් සිදු කර ඇත. | අය කරගත් ලංසු ඇපකර ආදායමක් ලෙස ගිණුම්ගත කළ යුතුය. |
| (උ) | වර්ෂ 04 සිට 12 දක්වා කාලයක් තුළ හිමිකම් නොපෑ රු.796,000 ක ආපසු ගෙවිය යුතු ලංසු ඇපකර පිළිබඳ සොයාබලා හිමිකම් නොපාන්නේ නම් ආදායමට ගැනීමට කටයුතු නොකර ජංගම වගකීමක් ලෙස දක්වා තිබුණි. | එකඟ වේ.<br>මේ සම්බන්ධයෙන් විගණන කමිටුව වෙත ඉදිරිපත් කර එම කමිටු නිර්දේශ අනුව කටයුතු කරනු ලැබේ. | හිමිකම් නොපාන බව සනාථකර ගැනීමෙන් පසු ලංසු ඇපකර ආදායමට ගත යුතුය. |
| (ඌ) | 2020/2021 ගිණුම් වර්ෂයේ පාරිභෝජන ද්‍රව්‍ය ගිණුමේ ඇතුළත් ලිපි ද්‍රව්‍ය, ජලනළ උපාංග, ගොඩනැගිලි ද්‍රව්‍ය සහ වාහන අමතර කොටස් යනාදියේ රු.2,441,181 ක ඌනතාවයක් වාර්තා වී ඇති අතර ඒ සම්බන්ධයෙන් විමර්ශනයන් සිදුකර වගකිව යුත්තන්ගෙන් අයකර ගැනීම වෙනුවට ඌනතාවයේ අගය වෙනත් ලැබිය යුතු වටිනාකමක් ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණි. පසුව එකී ඌනතාවය පිළිබඳ කරුණු පරීක්ෂාකර ඉන් රු.2,010,196 ක වටිනාකම ගබඩාව තුළ නිකුත් නොවූ ස්ථාවර වත්කම් වශයෙන්ද රු.15,470 ක වටිනාකමින් යුතු පරිභෝජන අයිතම කිහිපයක් භෞතික තොගයට ඇතුළත් වියයුතු බවද ඒ අනුව ද්‍රව්‍ය ගබඩාවේ සත්‍ය ඌනතාවය රු.415,514 ක් ලෙස අනාවරණය කරගත් බවත් සභාපති විසින් විගණනය වෙත වාර්තාකර තිබුණි. නමුත් ප්‍රවර්තන වර්ෂයේදී ඒ සම්බන්ධයෙන් කිසිදු ගැළපීමක් සිදු නොකර තවදුරටත් රු.2,441,181 ක ඌනතාවය ලැබියයුතු වටිනාකමක් ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ දැක්වීම හේතුවෙන් ජංගම නොවන වත්කම් රු.2,010,196 කින් හා ජංගම වත්කම් රු.15,470 කින් අවතක්සේරුවී ඇති අතර වර්ෂයේ ලාභය රු.415,514 කින්ද අධිගණනය වී ඇති බව නිරීක්ෂණය විය. | එකඟ වේ.<br>සමාලෝචිත වර්ෂය තුළදී අදාළ ගැළපීම් සිදුකොට නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. | ඌනතාවය ගැළපීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (එ) | ඉන්වොයිස් දිනය පදනම් කරගනිමින් වර්ෂයට අදාළ නැව් නිෂ්කාශන ආදායම හඳුනා ගැනීම සමාගමේ ප්‍රතිපත්තිය වේ. ඒ අනුව පෙර වර්ෂයට අදාළ හා එම වර්ෂයේදී ලැබියයුතු නැව් නිෂ්කාශන ආදායම් ලෙස ගිණුම්ගත කරන ලද රු.6,045,000 ක නිෂ්කාශන ආදායමට අදාළව ප්‍රවර්තන වර්ෂයේදී මුදල් ලැබීමේදී එය විවිධ ණයගැති ගිණුමට බැර කිරීම වෙනුවට ප්‍රවර්තන වසරේ නිෂ්කාශන ආදායම් ගිණුමට බැරකර ඇත. තවද, ප්‍රවර්තන වර්ෂයට අදාළ රු.1,264,000 ක නිෂ්කාශන ආදායම් පෙර වර්ෂයේදී ලැබිය යුතු ආදායමක් ලෙස ගිණුම්ගතකර ඇති අතර එය නිවැරදි නොකර ප්‍රවර්තන වර්ෂයේදීද ආදායම් ලැබීමක් ලෙස හඳුනාගෙන ඇත. ඒ අනුව උක්ත ගිණුම්ගත කිරීම හේතුවෙන් ජංගම වත්කම් හා වර්ෂයේ ලාභය රු.7,309,000 කින් අධිගණනය වී ඇති බව නිරීක්ෂණය විය. | එකඟවේ. 2022/23 මෙම ගිණුම් සංකේත වැරදියට සටහන් වීමේ දෝෂය හඳුනාගෙන JV/BK/2022-23/14 හා JV/BK/2022-23/15 මගින් නිවැරදි කොට 2023.03.31 දින ගිණුමට ගැළපීම් සිදු කර ඇත. | වර්ෂයට අදාළ ආදායම් නිසි පරිදි හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඒ) | 2020/2021 ආනයනික පොහොර තොගයන්ට අදාළව සිදු කරන ලද නියැදි පරීක්ෂණ වාර්තා හා විශ්ලේෂණ වාර්තාවන් වෙනුවෙන් 2021 අප්‍රේල් 27 දින ගෙවන ලද රු.732,188 ක් ආනයන මිලදී ගැනුම් අත්තිකාරම් ලෙස වත්කම් ගිණුමකට හර කර ඇති අතර, එය වියදම් ලෙස ගිණුම්ගතකර නොතිබීමෙන් වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් අධිගණනය වී තිබුණි. | එකග වේ . අදාළ ගැළපීම් සිදුකොට නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. | වර්ෂයට අදාළ සත්‍ය වියදම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඔ) | නැව්ගත කිරීම් වෙනුවෙන් ගෙවීම් අත්තිකාරම් ගිණුම තුළ රු.500,000 ක අත්තිකාරම් පියවීමක් වැරදි ලෙස වැඩියෙන් සටහන් වීම හේතුවෙන් අදාළ වියදම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණු අතර අත්තිකාරම් ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. මේ හේතුවෙන් වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් අවතක්සේරු වී තිබුණි. | එකඟ වේ. සමාලෝචිත වර්ෂය තුළදී අදාළ ගැළපීම් සිදුකොට නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. | වර්ෂයට අදාළ වියදම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඕ) | පුද්ගලික පොහොර සමාගම් සමඟ පොහොර තොග ණය පදනමට හුවමාරු කරගැනීමේදී අදාළ ගනුදෙනුව එකම ගිණුම් වර්ෂයක් තුළදී අවසන් කර නොතිබීම හේතුවෙන් ගිවිසුමේ සඳහන් තොගයේ පිරිවැය වන රු.165,000,000 වෙනුවට මූල්‍ය ප්‍රකාශනවල රු.34,962,000 ක් ගිණුම් ගත කිරීම හේතුවෙන් සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල | එකඟ නොවේ. පොහොර තොග ණය පදනම මත හුවමාරු කර ගැනීමේ ගිවිසුම් ප්‍රකාරව තොගය හුවමාරුවේ දී පිරිවැය හෝ උපලබ්ධි යන අගයෙන් අඩු අගය මත ගිණුම් ගත කළ යුතුවේ. අප ආයතනය විසින් භාණ්ඩ හුවමාරු කිරීමේ පදනම | පොහොර තොග ණය පදනමට හුවමාරු කර ගැනීමේදී තොගයේ වටිනාකම පිරිවැය මත අගය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | දක්වා තිබුණු විකුණුම් පිරිවැය රු.130,038,000 ක් වැඩියෙන් දක්වා තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය. තවද, එම ගිවිසුම අනුව උක්ත තොග නැවත සමාගමට ආපසු ලැබෙන නිශ්චිත දිනයක් සඳහන්කර නොතිබුණු අතර තොග නැවත ලබාදෙන දිනය ලෙස ක්ෂණික නැව්ගත කිරීම ළඟාවීමෙන් පසු ලෙස අවිනිශ්චිත දිනයක් සඳහන් කර තිබුණි. | මත තුන්වන පාර්ශවයක් වෙත භාණ්ඩ නිකුත් කිරීමේදී අදාළ මිල තීරණය කරනු ලැබුවේ වෙළඳපොල වටිනාකම මත වේ. | |
| (ක) | රසායනික පොහොර තහනම ක්‍රියාත්මක වන අවධියක අමාත්‍ය මණ්ඩල තීරණ අනුව ගොවීන් වෙත සහනාධාර ලෙස ලබා දීම සඳහා ආනයනය කළ රසායනික පොහොර තොග අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව සමාගම විසින් ජාතික පොහොර ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂකගේ අංක SMFI/2/D/NFS/11 පොදු දරන 2021 සැප්තැම්බර් 14 දිනැති ලිපිය මගින් කළ ඉල්ලීමක් අනුව යූරියා පොහොර මෙ.ටො. 10 ක් දංකොටුව, නාත්තන්ඩිය ප්‍රදේශයේ පුද්ගලික සමාගමකට ලබාදී තිබුණි. උක්ත පොහොර නිකුත් කිරීමේදි එහි වාණිජ වටිනාකම ලෙස රු. 900,000 ක මුදලක් ඇප තැන්පතුවක් ලෙස ලබාගැනීමට සමාගම කටයුතු කර තිබුණු අතර එම මුදල වරදවා ණයගැති ගිණුමකට බැර කිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල වත්කම් හා වගකීම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | එකඟ වේ.<br>සමාලෝචිත වර්ෂය තුළදී අදාළ ගැළපීම් සිදුකොට නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. | ගොවීන්ට සහනාධාර ලෙස ලබාදීම සඳහා ආනයනයනික රසායනික පොහොර පෞද්ගලික පාර්ශවයන්ට ලබාදීමේදි අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලබා ගැනීමත්, ඇප තැන්පතු නිසි ලෙස ගිණුම් තැබීමත් සිදු කළ යුතුය. |
| (ග) | කොළඹ ප්‍රදේශයේ පුද්ගලික පොහොර සමාගමකට ණය පදනම මත පෙර වර්ෂයේදී ලබාදී තිබුණු පොහොර මෙ. ටොන් 250 ක් සමාලෝචිත වර්ෂයේදී සමාගම වෙත නැවත ලබාගෙන තිබුණු අතර පෙර වර්ෂයේදී එම පොහොරවල හුවමාරු වටිනාකම රු.7,500,000 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. සමාලෝචිත වර්ෂයේදී අදාළ පොහොර නැවත ලබාගැනීමේදී පොහොර තොගයේ වටිනාකම රු.6,600,000 ක් ලෙස රු.900,000 කින් අඩුවෙන් ගිණුම්ගත කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල විකුණුම් පිරිවැය රු.900,000 කින් වැඩියෙන් දක්වා තිබුණි. | එකඟ වේ.<br>සමාලෝචිත වර්ෂය තුළදී අදාළ ගැළපීම් සිදුකොට නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. | පොහොර තොග ණය පදනමට හුවමාරු කර ගැනීමේදී තොගයේ වටිනාකම පිරිවැය මත අගය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ච) | මාතලේ දිස්ත්‍රික්කය තුළ ලක්පොහොර ගබඩාව ස්ථාපිත කර ඇති වාරියපොල වත්ත නැමැති පර්. 29.93 ක් වපසරිය සහිත ඉඩම, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් 2020 සැප්තැම්බර් 10 දින සමාගම වෙත ඔප්පුවක් මගින් නීත්‍යානුකූලව පවරාදී ඇතත් එම ඉඩම තක්සේරුකර ගිණුම්ගත නොකිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන තුළ ජංගම නොවන වත්කම් අවතක්සේරු වී තිබුණි. | එකඟ වේ. වරලත් තක්සේරුකරුවකු මාර්ගයෙන් විධිමත්ව තක්සේරුවක් ලබාගෙන මෙම ගිණුම් වර්ෂයේ දී ගිණුම් වලට ගැළපීම් කරනු ලැබේ. | ඉඩම තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |
| (ජ) | සමාගම විසින් 2021 අගෝස්තු 06 වන දින රු.2,916,000 ක් පිරිවැය වූ බහාලුම් කාර්යාල 4 ක් මිලදී ගෙන ඇති අතර ඒ සඳහා මුදලින් ගෙවන ලද රු.2,781,000 ක වටිනාකම පමණක් අදාළ වත්කම් ගිණුමේ සටහන්කර ඊට අදාළ රඳවුම් මුදල් වටිනාකම වන රු.135,000 ක මුදල අදාළ වත්කම් ගිණුමේ හා රඳවුම් මුදල් ගිණුමේ සටහන් කර නොතිබුණි. ඒ අනුව ජංගම නොවන වත්කම් හා ජංගම වගකීම් එම වටිනාකමෙන් අවතක්සේරුවී ඇති බව නිරීක්ෂණය විය. | එකඟ වේ. සමාලෝචිත වර්ෂය තුළදී අදාළ ගැළපීම් සිදුකොට නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. | රඳවුම් මුදල් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ට) | සමාගම සතු බංගලා අංක 02 හි අලුත්වැඩියා කිරීම ඇතුළු නවීකරණ කටයුතු සඳහා වූ මුළු පිරිවැය රු.2,226,150ක් වන අතර ඒ සඳහා ගෙවන ලද පළමු වාරිකය වන රු.1,446,997 ක වටිනාකම පමණක් ගොඩනැගිලි ගිණුමේ සටහන්කර තිබුණි. ඒ අනුව ඊට අදාළ රඳවුම් මුදල වන රු.111,307 ක වටිනාකම රඳවුම් මුදල් ගිණුමේ සහ අදාළ වත්කම් ගිණුමේ සටහන් නොකිරීම හේතුවෙන් ජංගම නොවන වත්කම් හා ජංගම වගකීම් එම වටිනාකමෙන් අවතක්සේරුවී තිබුණි. | එකඟ වේ. සමාලෝචිත වර්ෂය තුළදී අදාළ ගැළපීම් සිදුකොට නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. | වත්කමට අදාළ පිරිවැය නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

### 1.5.3 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| | අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තුමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක PED/S/CFCL/03/06 (i) දරන 2022 අප්‍රේල් 08 දිනැති සහ අංක PED/P/04/24(i) දරන 2021 අප්‍රේල් 06 දිනැති ලිපි අනුව සමාගම විසින් වාර්ෂිකව ලබාගන්නා නැව් භාණ්ඩ බෑම කඩිනම් කිරීමේ ආදායමෙන් සියයට 50 ක ප්‍රමාණයක් පමණක් සේවකයන්ගේ කාර්යසාධනය මත පදනම්ව මාස තුනක මූලික වැටුපට සමාන උපරිමයකට යටත්ව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ දිරි දීමනා ලෙස ගෙවිය යුතු වුවත්, සමාගම විසින් සදොස් ලෙස සේවකයන්ගේ මූලික වැටුප හා ජීවන වියදම් | නිරීක්ෂණයෙහි සඳහන් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ චක්‍රලේඛයට අමතරව එම දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ 2021.12.21 දිනැති අංක PED/S/CFCL/03/06 (i) දරන අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ ලිපිය අනුව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිතව මාස 03ක වැටුපට සමාන උපරිම මුදලකට යටත්ව සේවක දිරිදීමනා ගෙවීම් කිරීම සිදුකර ඇත. | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛ ප්‍රකාරව නිලධාරියාගේ මූලික වැටුප පදනම් කරගෙන දිරි දීමනා ගණනය කර වැඩිපුර ගෙවූ දිරි දීමනා අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | දීමනාව යන දෙකෙහි එකතුව පදනම වශයෙන් ගෙන සමාලෝචිත වර්ෂය තුළ රු.48,431,198 ක දිරි දීමනා ගෙවීම් කර ඇති අතර ඉන් රු.8,242,375 ක් චක්‍රලේඛ විධි විධාන වලට පටහැනි බව නිරීක්ෂණය විය. | | |
| (ආ) | අමාත්‍ය මණ්ඩල අනුමැතිය යටතේ වී ගොවීන් වෙත නිකුත් කිරීමට ආනයනය කරන ලද පොහොර තොග කැලණිය, කොළඹ හා මාකොළ යන ප්‍රදේශවල පෞද්ගලික පොහොර සමාගම් වෙත ණය පදනම මත ලබාදීමට හා එම සමාගම්වලින් ණය පදනම මත පොහොර ලබාගැනීමට සමාගම කටයුතු කර තිබුණි. ඒ අනුව පොහොර මෙ.ටොන් 2,504 ක් පෞද්ගලික පොහොර සමාගම් වෙත ණය පදනම මත ලබා දීමටත් තවත් පොහොර මෙ.ටොන් 5,066 ක් පෞද්ගලික පොහොර සමාගම් වෙතින් ණය පදනම මත ලබාගැනීමටත් සමාගම කටයුතු කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී පෙර වර්ෂයේදී පෞද්ගලික පොහොර සමාගම් වෙතින් ලබාගත් පොහොර මෙ.ටොන් 3,496.2 ක් නැවත ලබාදීම හා පෞද්ගලික පොහොර සමාගම් වෙත ලබාදුන් පොහොර මෙ.ටොන් 250 ක් නැවත ලබාගැනීම සිදුකර තිබුණි. මෙය පොහොර ආනයනය සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් දෙන ලද අනුමැතියට අනුකූල නොවන ක්‍රියාවක් ලෙස නිරීක්ෂණය කෙරේ. | එකඟ නොවේ.<br>හුවමාරු පදනම මත පොහොර නිකුත් කිරීම් හා පොහොර ලබා ගැනීම් සිදුකර ඇත්තේ ජාතික පොහොර ලේකම් කාර්යාලයේ අනුමැතිය පරිදි ගිවිසුම් ගතවීමෙන් මේ වන විට හුවමාරු පදනම මත ලබාදුන් හා ලබාගත් පොහොර පියවීම් සිදුකර ඇත. | අමාත්‍ය මණ්ඩල අනුමැතියක් නොගෙන පොහොර ණය පදනම මත පෞද්ගලික සමාගම් වෙත ලබානොදිය යුතුය. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

සමාගම විසින් රජයේ දෙපාර්තමේන්තු හා ආයතන, ගොවිජන සේවා මධ්‍යස්ථාන, අලෙවි නියෝජිතයන් සහ බෙදාහරින්නන් වෙත ණය පදනම මත පොහොර නිකුත් කිරීම හේතුවෙන් සමාගමට අයවිය යුතුව පවතින ශේෂයන්හි මුළු වටිනාකම රු.1,530,184,011 ක් වන අතර එහි ඇතුළත් ශේෂයන් සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණයන් පහත පරිදි වේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ණය පදනම මත පොහොර ලබාදීම වෙනුවෙන් වසර 10 ක සිට පැවත එන ජනතා වතු සංවර්ධන මණ්ඩලයෙන් හා රාජ්‍ය වැවිලි සංස්ථාවෙන් පිළිවෙලින් රු.37,993,346 ක මුදලක් හා රු.35,931,679 ක මුදලක් සමාගමට අයවිය යුතු වුවත් එම ශේෂයන් අයකර ගැනීමට සමාගම අපොහොසත් වී ඇති අතර ස්ථාවර වත්කමක් සමාගම වෙත පවරා ගැනීමට වරින් වර අදාළ | එකඟ වේ.<br>ජනතා වතු සංවර්ධන අධිකාරියෙන් හා රාජ්‍ය වැවිලි සංස්ථාවෙන් පිළිවෙලින් රු.37,993,346 ක මුදලක් හා රු.35,931,679 ක මුදල අයකර ගැනීම සම්බන්ධයෙන් 2023.05.15 දින වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්තුමා සමඟ පැවැත්වූ සාකච්ඡාව පරිදි 2023.12.31 දින වන විට මෙම හිඟ ණය මුදල ගෙවා අවසන් කිරීමට එම ආයතන | ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ආයතනයන් සමඟ එකඟත්වයන්ට පැමිණ ඇතත් ඒවා ඵලදායී ලෙස ක්‍රියාත්මක වී නොමැති බවත් නිරීක්ෂණය විය. | දෙකම එකඟ වූ අතර මේ සම්බන්ධව සිහිකැඳවීම් ලිපියක්ද මේවන විට අප විසින් යොමු කර ඇත. | |
| (ආ) | පැල්වත්ත සීනි සමාගමේ වර්ෂ 03 ඉක්මවූ රු.807,650 ක් හා ඉබ්බාගමුව වී පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ වර්ෂය ඉක්මවූ රු.120,500ක ණය ශේෂ අයකර ගැනීමට විගණිත දින වන විටත් සමාගම අපොහොසත් වී ඇති බව නිරීක්ෂණය විය. | එකඟ වේ.<br>2018 වර්ෂයේ සිට පැලවත්ත සීනි සමාගම වෙත සපයනු ලද පොහොර වෙනුවෙන් අයවිය යුතු මුදල් ශේෂය පිළිබඳ සමාගම එකඟතාවයක් පල කර නොමැත. ශේෂය තහවුරු කිරීම් ලිපි ලබාදී නොමැත. අභ්‍යන්තර විගණන අංශයෙන්ද මේ පිළිබඳ විශේෂ පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කරනු ලැබේ.<br>2020 යල කන්නය සඳහා ජාතික පොහොර ලේකම් කාර්යාලයේ උපදෙස් පරිදි සහනාධාර පොහොර නිකුත් කිරීම මුදල් අය කිරීමකින් තොරව නිකුත් කරන ලෙස සඳහන් කළද බතලේගොඩ වී පර්යේෂණ ආයතනය වෙත ණය ඉන්වොයිස්පත් වටිනාකම සහිතව නිකුත් කර ඇත. ලබා දුන් පොහොර වෙනුවෙන් පරිහරණ වියදම් වශයෙන් මහා භාණ්ඩාගාරයෙන් අයවිය යුතු මුදල රු.125,900 කි. පරිහරණ වියදම් සඳහා මුදල් ජාතික පොහොර ලේකම් කාර්යාලයෙන් ඉල්ලීම් කළද මෙතෙක් ලැබී නොමැති අතර ප්‍රවර්ථන වර්ෂය තුළදී මෙම මුදල් ලබා ගැනීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකරනු ලැබේ. | ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාගම වෙත සමාලෝචිත වර්ෂය අවසාන දින වන විට ගොවිජන සේවා මධ්‍යස්ථාන 346 ක් වෙතින් අයවිය යුතු මුළු වටිනාකම රු.1,385,011,522 ක් වන අතර ඉන් රු.490,990,037 ක් වර්ෂ 01 සිට වර්ෂ 05 දක්වා කාල පරාසයක පවතින ණය ශේෂ බව නිරීක්ෂණය විය. | එකඟ නොවේ.<br>2018/19 මහ කන්නය සඳහා පොහොර වැඩසටහන යටතේ මහියංගණය ගොවිජන සේවා මධ්‍යස්ථානය වෙත ණයට පොහොර ලබාදීම වෙනුවෙන් 2018 වර්ෂයේ සිට හිඟව පවතින මුදල රු.1,839,321 කි. මේ සම්බන්ධයෙන් කෘෂිකර්ම අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශයේ හා ජාතික විගණන කාර්යාලයේ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් ඒකාබද්ධ පරීක්ෂණයක් පවත්වා එම නිර්දේශ ලබා ගැනීම සුදුසු බව සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව මඟින් 2023.07.27 දින අප වෙත යොමු කළ අංක DFD/FSCS/OFC/2023 දරන ලිපිය මඟින් දක්වා ඇත. | ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ගොවිජන සේවා මධ්‍යස්ථාන වෙතින් අයවීමට තිබෙන මුළු මුදල රු.1,385,011,522 ක තුළ වසර 1 ත් 2 ත් අතර කාලයට අදාළ රු.489,150,725 ක මුදලක් අයවීමට ඇති අතර ඉතිරිය ගොවිජන සේවා මධ්‍යස්ථාන වෙතින් අයවිය යුතු පරිහරණ වියදම් වේ.මේ වන විට එම මුදල් ලැබෙමින් පවතී.<br>ඒ අනුව මෙම රු.490,90,037 කින් රු.489,150,725 ක මුදල වසර 1ත් 2ත් අතර කාලයටත් රු.1,839,321 ක මුදල පමණක් වසර 5ක පරාසයක් දක්වා විහිදී යන බවත් දක්වමි. | |
| (ඇ) | අලෙවි නියෝජිතයන් වෙත සමාගම විසින් ණය පදනම මත නිකුත් කරන ලද පොහොර තොග සඳහා තවදුරටත් අයවිය යුතුව පවතින වර්ෂ 04 සිට වර්ෂ 10 දක්වා කාල පරාසයක් තුළවූ එකතු වටිනාකම රු. 13,239,202 ක් බව නිරීක්ෂණය විය. | එකඟ වේ.<br>මෙම ගණුදෙනුකරුවන් පිළිබඳ විස්තර මෙයට අමුණා ඇත.<br>පෞද්ගලික ආයතන වෙතින් වසර 04 කට පෙර සිට අයවිය යුතු රු.13,239,202 ක මුදලින් පෙර වර්ෂවල අතිරික්ත මුදල වන රු.347,119 ක් අඩු කළ පසු අයවිය යුතු ශේෂය රු.12,892,083 කි. ඉන් වසර 04 සිට 05 දක්වා අයවීමට ඇති මුදල රු.11,820,298 වේ. වසර 08 සිට වසර 09 දක්වා අයවීමට ඇති මුදල රු.878,607ක් සහ වසර 10ට වැඩි ප්‍රමාණය රු.193,178 කි.<br><br>මෙම ගණුදෙණුකරුවන් අතරින් වීරසිංහ කන්ස්ට්‍රක්ෂන්ස් වෙතින් අයවිය යුතු මුළු මුදල වන රු.936,100 අයකර ගැනීම සඳහා ගම්පහ දිසා අධිකරණයේ නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති අතර ඇස්කීසී ක්‍රියාත්මක කිරීමට නියමිතව ඇත.<br><br>බ්‍රිජන් කෙමිකල්ස් වෙතින් අයවිය යුතු රු.878,607ක් අයකර ගැනීමට පොළොන්නරුව මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක 1695/M යටතේ නඩු පවරා ඇත.<br>අයිතිකරු මියගොස් ඇත.<br><br>ගම්පහ දිසා අධිකරණයේ නඩු අංක 51/21/M යටතේ නඩු පවරා ඇති අතර කොටස් වශයෙන් ගෙවීම් කර සචින්ත ස්ටෝර්ස් වෙතින් තවදුරටත් අයවිය යුතු ණය මුදල රු.380,200 කි. | ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | හේඩේ ඇග්‍රෝ බිස්නස් වෙතින් රු.10,230,000 ක අයවිය යුතු මුදල සඳහා ගම්පහ දිසා අධිකරණ නඩු අංක 330/20/M යටතේ නඩු පවරා ඇත.<br>පහත සඳහන් ගණුදෙනුකරුවන්ගෙන් අය විය යුතු මුදල් රු.250,000 ට අඩු අගයක් වන බැවින් නීතිමය ක්‍රියාමාර්ගයක් ගත නොහැකි බැවින් ණය කමිටුවක් පත් කර කමිටු නිර්දේශ මත ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ.<br>•මහේෂ් කුමාර- රු.193,178<br>•ශිරන්ත ඇග්‍රෝ කෙමිකල්ස් - රු.137,950<br>•DNW ස්ටෝර්ස් - රු.146,595<br>•තරුෂිකා ට්‍රේඩර්ස් - රු.118,850<br>•දිසුළ ඇග්‍රෝ කෙමිකල්ස් - රු.217,768 | |
| (ඉ) | සමාගමේ සිට ගොවිජන සේවා මධ්‍යස්ථාන වෙත පොහොර බෙදාහරින්නන් වෙතින් සමාගමට අයවිය යුතුව පවතින වර්ෂ 04 ක කාලයක් ඉක්මවූ ණය ශේෂයන්හි එකතු වටිනාකම රු.44,941,885 ක් බව විගණනයේදී නිරීක්ෂණය විය. | එකඟ වේ.<br>දියර පොහොර සැපයීම වෙනුවෙන් 2014 සිට බෙදාහරින්නන්ගෙන් අයවිය යුතු ශේෂය රු.44,941,885 කි.<br>සබුර්කාන් අම්ර්ජිත්කාන් ගෙන් රු.9,708,564 ක ණය මුදල අයකර ගැනීම සඳහා ගම්පහ දිසා අධිකරණ නඩු අංක 216/20M යටතේ නඩු පවරා ඇත.<br>ජී.එන්.කේ. ගමගේ ගෙන් රු.10,216,221 ක ණය මුදල අයකර ගැනීම සඳහා වත්තල මහේස්ත්‍රාත් අධිකරණ නඩු අංක B2090/20 යටතේ ඔහුට එරෙහිව නඩු පවරා ඇති අතර ගම්පහ දිසා අධිකරණයේ සිවිල් නඩුවක් ගොනු කිරීමට අදාළව නීතිපති දෙපාර්තමේන්තුව කටයුතු සිදු කරමින් පවතී.<br><br>සුහද ඇග්‍රෝ වෙතින් අයවිය යුතුව ඇති රු.1,989,608 ක ණය මුදල 2022.06.06, 2022.06.15 සහ 2022.09.19 දින වාරික වශයෙන් සම්පූර්ණයෙන් ගෙවීම් කර ඇත.<br>ශ්‍රී ලංකා පාරිභෝගික සමිති සමූපකාර සංගමය මඟින් අයවිය යුතුව ඇති රු.23,027,492 ක ණය මුදල සම්බන්ධව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නඩු අංක B 3397/21 යටතේ වත්තල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා ඇති අතර නීතිපති දෙපාර්තමේන්තුව විසින් සිවිල් නඩු පැවරීමට කටයුතු සිදු කරමින් පවතී. | ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පොහොර ඌනතාවයන් මත ගබඩා භාරකරුවන්ට එරෙහිව නඩු පවරා 2014 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා එම නිලධාරීන්ගෙන් අය කර ගෙන තිබුණු එකතු වටිනාකම රු.14,962,309 ක් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීම වෙනුවට එය භාණ්ඩාගාරයට ගෙවිය යුතු වටිනාකමක් ලෙස වර්ෂ ගණනාවක සිට මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණි. | එකඟ වේ. සහනාධාර පොහොර තොග ඌනතාවයන් මත 2014 වසරේ සිට 2021 වසර දක්වා විවිධ තොග අලෙවි නියෝජිතයන් හා ගබඩා භාරකරුවන්ගෙන් නඩු පවරා අයකරගන්නා ලද මුදල් මහා භාණ්ඩාගාරයට ගෙවිය යුතු සේ ගිණුමේ සටහන්ව ඇත. මේ වන විට මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු මුදල් ඉල්ලුම් කර 2023.07.12 වන දින මුදල් ඉල්ලුම් කර රේඛීය අමාත්‍යාංශයේ ලේකම්තුමා වෙත යවන ලද ලිපියට අනුව මහා භාණ්ඩාගාරයෙන් මුදල් ලද පසු මෙම මුදල් නැවත මහා භාණ්ඩාගාරය වෙත ගෙවීම් කිරීමට කටයුතු කරනු ඇත. | භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළ යුතු මුදල් නොපමාව ප්‍රේෂණය කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.3 අත්තිකාරම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නැව්ගත කිරීම් වලට අදාළ වියදම් දැරීම වෙනුවෙන් 2007 වර්ෂයේදී අත්තිකාරම් ලෙස ලබාදුන් බවට රු.2,143,772 ක් ගිණුම්ගත කර තිබුණද විගණිත දිනය වන විටද පියවා නොතිබුණු අතර එම අත්තිකාරම ලබාගත් නිලධාරියා තහවුරු කරගැනීමට සමාගමට නොහැකිව තිබුණි. | එකඟ වේ. 2007 වර්ෂයේදී අත්තිකාරම් ලෙස ප්‍රසම්පාදන අංශය වෙත ලබාදී ඇති රු.2,143,772 ක බිල්පත් ඉදිරිපත් කිරීම හෝ මුදල් ආපසු පියවීම සිදුකොට නොමැති බැවින් අත්තිකාරම් ලෙස ගිණුම් වල සටහන් කොට ඇත. | අදාළ ශේෂය තහවුරුකර ගැනීමෙන් පසු නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.81,575,919 ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.124,392,743 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 42,816,824 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට විකුණුම් ආදායම, විවිධ ආදායම් හා නිෂ්කාශන ආදායම්හි අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මහවැලි අධිකාරිය, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව, දුම්රිය දෙපාර්තමේන්තුව වැනි රජයේ ආයතන වලට අයත් ගොඩනැගිලිවල පිහිටි ගබඩා සමාගමේ මෙහෙයුම් කටයුතු සඳහා යොදාගනු ලබන අතර ඒවා හිඟුරක්ගොඩ, අකුරැස්ස, මාතලේ, | එකඟ නොවේ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16ට අනුව නියමිත කල්බදු ගිවිසුමකින් තොරව හෝ සමාගමට අයිතියක් නොමැති දේපළක්, දේපළ පිරියත හා උපකරණ යටතේ ගිණුම් වලට සටහන් කිරීමට නොහැක. ඒ සම්බන්ධව අවසන් ගිණුම් තුළ සටහන් අංක 11 යටතේ පැහැදිලිව හෙළිදරව් කොට ඇත. | නීත්‍යානුකූල හිමිකාරිත්වය ලබා ගැනීමට සහ කල්බදු විධිවිධාන පැහැදිලිව හඳුනා ගැනීමට කටයුතු කර නිසි පරිදි ගබඩාවල වටිනාකම මූල්‍ය ප්‍රකාශන තුළ දැක්විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කුරුණෑගල, නුවරඑළිය, කෑගල්ල, මැදවච්චිය, කුරුවිට,දොඩන්ගොඩ, මතුගම, කොග්ගල හා වීරවිල යන ප්‍රදේශයන්හි පවත්වාගෙන යනු ලැබේ. එම ප්‍රාදේශීය පොහොර ගබඩාවන්හි නීත්‍යානුකූල හිමිකාරිත්වය ලබා ගැනීම හෝ කල්බදු විධිවිධාන පැහැදිලිව හඳුනා ගැනීමක් හෝ උක්ත ගබඩාවල වටිනාකම දේපළ පිරියත උපකරණ යටතේ හඳුනා ගැනීමක් සිදුකර නොමැති බව නිරීක්ෂණය විය. | | |
| (ආ) | 2019 ජනවාරි 31 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 265/19/01 ප්‍රකාරව ගනු ලැබූ 2019 මාර්තු 29 දිනැති අංක 2412 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මගින් සමාගම සතු නුවරඑළිය හා පොළොන්නරුව නිවාඩු නිකේතන වෙන් කිරීමේදී අයකළයුතු ගාස්තු සම්බන්ධයෙන් නිශ්චිතව දක්වා තිබුණි. එම උපදෙස් වලට පටහැනිව ගාස්තු අයකිරීම හේතුවෙන් 2020, 2021 සහ 2022 වර්ෂයන්හි වෙන් කිරීම් සිදුකිරීමේදී සමාගමට අහිමිව ඇති ආදායම රු.462,000 කි. එසේම ඇතැම් අවස්ථාවන්හිදී සමාගමෙන් පරිබාහිර නිලධාරීන්ට හා ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් සඳහාද නිවාඩු නිකේතනය නොමිලේ ලබාදීම හේතුවෙන් රු.339,000 ක අලාභයක් හා ඇතැම් පුද්ගලයන් වෙත නොමිලේ ආහාරපාන සැපයීම වෙනුවෙන් රු.89,696 ක පිරිවැයක් දරා තිබුණි. තවද, එවැනි අවස්ථාවන් වලදී පූර්වයෙන් අත්තිකාරම් ගෙවා සිදුකර තිබූ වෙන් කිරීම් අවලංගුකර තිබූ අතර ඉන් අහිමි වූ ආදායම රු.112,500 කි. | එකඟ වේ<br>අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 265/19/01 ප්‍රකාරව ගනු ලැබූ අංක 2412 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මගින් සමාගමේ අභ්‍යන්තර සාමාජිකයන් ලෙස සලකා එම ගාස්තු හා රේටයන් අනුව පරිබාහිර ඇතැම් පුද්ගලයන් වෙත ඉහළ කළමනාකාරීත්වයේ උපදෙස් පරිදි නිවාඩු නිකේතනය වෙන්කර දී ඇත. 2020/21 සහ 22 වර්ෂ වලදී සිදුවී ඇති අලාභ අයකර ගැනීම සඳහා වගකිව යුතු පාර්ශව හඳුනා ගැනීම් කර ඉදිරි කටයුතු සිදු කරන බව දන්වා සිටිමි.සමාගමට අහිමිව ඇති ආදායම රු.419,000 ක් නොව රු.287,500 ක් බව සඳහන් කරමි.<br>උත්සව සමය හා උත්සව නොවන සමය/සතියේ දින හා සතිඅන්ත දිනයන්/රජයේ නිවාඩු දිනයන් පිළිබඳ සැලකිල්ල නොදක්වා නිවාඩු නිකේතනයේ රැඳී සිටි පාර්ශවයන්ගෙන් මුදල් අයකර ඇති අතර ඒ අනුව සමාගමට අහිමි වී ඇති ආදායම රු.43,000ක් නොව රු.9,000ක් බව සඳහන් කරමි. මේ සඳහා වගකිව යුතු පාර්ශව හඳුනා ගැනීම් කර ඉදිරි කටයුතු සිදු කරන බව දන්වමි.<br>සමාගමේ අභ්‍යන්තර නිලධාරීන් සඳහා රාජකාරී අවශ්‍යතාවය මත නිවාඩු නිකේතනය නොමිලේ සපයා දීම 2016.07.10 වන දින අභ්‍යන්තර චක්‍රලේඛ අංක CFC/GM/internal circu මගින් සිදුකර ඇත. නමුත් රේඛීය අමාත්‍යාංශයේ හෝ රජයේ නිලධාරීන්ට නිවාඩු නිකේතන වෙන්කර දීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙලක් සකස් කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් ඉදිරියේදී අධ්‍යක්ෂ මණ්ඩලය වෙත කරුණු ඉදිරිපත් කර රාජකාරී කටයුත්තක් සඳහා නුවරඑළියට ගමන් කරන බාහිර | අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව ප්‍රකාරව අදාළ වෙන් කිරීම් සහ ගාස්තු අය කිරීම් සිදුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | නිලධාරීන්ගෙන් අයකර ගත යුතු ගාස්තු පිළිබඳ තීරණයක් ගැනීමට කටයුතු කරන බවද දන්වා සිටිමි. එසේම නිකේතනය වෙන් කිරීම සිදුකළ පසු නැවත අවලංගු කිරීම හා ආයතනයේ වියදමින් ආහාරපාන සැපයීම අනුමත කළ නොහැකි බැවින් මින් ඉදිරියට නිවැරදිව කටයුතු කරන අතර මේ පිළිබඳව සොයා බලා තීන්දු තීරණ ගැනීමට කටයුතු කරමි. | |
| (ඇ) | සමාගම සතුව 2023 මාර්තු 31 දින වන විට මෙ.ටොන් 56 ක කල් ඉකුත් වූ රසායනික පොහොර තොගයක් හා මෙ.ටොන් 26.7 ක ඇමදුම් පොහොර ප්‍රමාණයක් පැවති අතර මෙම පොහොර ප්‍රමාණය අපහරණය සම්බන්ධයෙන් සමාගම විසින් නිසි අලෙවිකරණ සැලැස්මක් ක්‍රියාත්මක කර නොතිබුණි. | එකඟ නොවේ.<br>ආයතනයේ සිදුවන මෙහෙයුම් කටයුතු වලදී ඇමදුම් පොහොර ලෙස යම්කිසි සුළු ප්‍රමාණයක් ඍජුවම නිකුත් කළ නොහැකි ලෙස තොගයෙන් ඉවත්වේ. නමුත් යම්කිසි කාලයක් එලෙස එකතු වූ ඇමදුම් පොහොර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ කෘෂිකර්ම අමාත්‍යාංශය දැනුවත් කර මූල්‍යමය ප්‍රතිලාභයක් ලැබෙන ලෙස බැහැර කිරීම කරනු ලබයි. නමුත් කල් ඉකුත් වූ පොහොර වශයෙන් කිහිප අවස්ථාවක පොහොර තොගයෙන් කපා හැරීමක් සිදු කරනු නොලැබේ. 2023.08.06 දිනැති පත්‍රිකා අංක 313/2023 දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව මගින් දැනට පවතින ඇමදුම් පොහොර තොග සමීක්ෂණ මණ්ඩලයක් ඉදිරියේදී සත්‍යාපනය කිරීමෙන් පසු දෙමුහුම් පොහොර නිෂ්පාදනය හෝ වෙනත් අර්ථිකමය වශයෙන් ඵලදායී කාර්යයකට යොදවා ගැනීමට අනුමැතිය ලබාගෙන ඇත.<br>2023.07.10 වැනි දින සිට අද දින වනතුරු පොහොර මෙ.ටොන් 176,087 ක ප්‍රමාණයක් මෙහෙයුම් කටයුතු වලදී හුණුපිටිය ගබඩා සංකීර්ණය තුළ ගබඩා කර ඇති අතර එම ප්‍රමාණය සැපයීමේදී ඇමදුම් පොහොර බවට පත්ව ඇති එම ප්‍රමාණය ඉතාම සුළු අගයකි. මෙවැනි කර්මාන්තයක් තුළ පවතින ඕනෑම ආයතනයක මෙහෙයුම් කටයුතු හා සැසඳීමේදී ඇමදුම් පොහොර ලෙස යම් සුළු ප්‍රමාණයක් තොගයෙන් ඉවත් වේ. | පවතින පොහොර සම්බන්ධයෙන් නිසි අලෙවිකරණ සැලැස්මක් සහිතව කටයුතු කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රසායනික පොහොර ආනයනය තහනම් කිරීමෙන් පසු රජයේ පොහොර ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට සමගාමීව පරිසර හිතකාමී පොහොර මිලදී ගැනීමේ වැඩසටහන යටතේ, සමාගමේ 2021 සැප්තැම්බර් 15 දිනැති අංක 2021/GM/02 දරන අභ්‍යන්තර චක්‍රලේඛය මගින් ප්‍රාදේශීය ගබඩා වෙතින් පොහොර සැපයුම්කරුවන් ලියාපදිංචිකොට ගෙන ඔවුන්ගෙන් කාබනික පොහොර මිලදී ගැනීමට අවස්ථාව සලසා දී තිබුණි. එසේ මිලදී ගත් පොහොර ප්‍රමාණයන් ඉතා අඩු සීඝ්‍රතාවයකින් අලෙවි වන බවත්, 2023 මාර්තු 31 දින වන විට රු.7,510,800 ක් පිරිවැය වූ පොහොර මෙ.ටොන් 315.28 ක් හා විගණනය වෙත වටිනාකම ඉදිරිපත් නොකළ පොහොර මෙ.ටොන් 586.86 ක ප්‍රමාණයක් අලෙවි නොවී හුණුපිටිය ප්‍රධාන ගබඩා සහ ප්‍රාදේශීය ගබඩාවන් තුළ ගොඩ ගසා ඇති බවත් නිරීක්ෂණය විය. | එකඟ වේ.<br>රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් මත රසායනික පොහොර ආනයනය කිරීම අත්හිටුවීම නිසා කාබනික කොම්පෝස්ට් පොහොර මිලදී ගැනීම හා බෙදාහැරීම සිදු කරන ලදී. එම මිලදී ගත් පොහොර ප්‍රමාණයන් සමාගමේ දිවයින පුරා පිහිටා ඇති ප්‍රාදේශීය පොහොර ගබඩාවන් මගින් අලෙවි කිරීමට කටයුතු කර ඇති අතර තවදුරටත් ඉතිරිව ඇති පොහොර ප්‍රමාණය අලෙවි කිරීම සඳහා පුවත්පත් දැන්වීමක් පලකර ප්‍රසම්පාදන ක්‍රමවේදය මගින් ගැනුම්කරුවෙකු තෝරාපත් කරගෙන ඇත. | පවතින පොහොර සම්බන්ධයෙන් නිසි අලෙවිකරණ සැලැස්මක් සහිතව කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 නොවැම්බර් 16 දිනැති භාණ්ඩාගාර ලේකම්ගේ අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සමඟ නිකුත් කරන ලද මෙහෙයුම් අත්පොතෙහි 6.6 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත සෑම රාජ්‍ය සමාගමක්ම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කොට විගණකාධිපති වෙත ඉදිරිපත්කළ යුතු වුවත්, 2021/2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී දින 447ක් ගතවීමෙන් පසුව විගණකාධිපති වෙත ඉදිරිපත්කර තිබුණි. | එකඟ වේ.<br>සමාලෝචිත වර්ෂයේ අවසන් ගිණුම් කටයුතු සමාගමේ ERP පද්ධතිය මඟින් පමණක් සිදුකළ අතර ඊට සමගාමීව අත්පොත් ක්‍රමයට ගිණුම් පිටපත් කිරීම සිදු නොකරන ලදී. ERP පද්ධතිය මගින් අවසන් ගිණුම් ලබා ගැනීමේදී විකුණුම් පිරිවැය අසාමාන්‍ය අගයකින් යුතු විය. එයට හේතු වී ඇත්තේ ERP පද්ධතිය මගින් තොගය ගණනය කිරීමේදී 2017 වර්ෂයේ සිට මිලදී ගත් තොගයේ වටිනාකම් විකුණුම් පිරිවැය නිවැරදිව ගිණුම්ගත නොවීමයි. එබැවින් මේ පිළිබඳව විගණන කමිටුව හා අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කොට නැවතත් අත්පොත් ක්‍රමයට ගිණුම් සකසා සැසඳීම් | චක්‍රලේඛ උපදෙස් පරිදි මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | සිදුකර ගිණුම් ඉදිරිපත් කිරීමට සිදුවූ හෙයින් මෙම කාලය ගත විය. | |
| (ආ) | 2021 නොවැම්බර් 16 දිනැති භාණ්ඩාගාර ලේකම්ගේ අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සමඟ නිකුත් කරන ලද මෙහෙයුම් අත්පොතෙහි 6.6 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී මාස 05ක් ඇතුළත සමාගමේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවද 2021/2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත්කිරීම ප්‍රමාදවීම මත 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව විගණිත දිනය වනවිටත් පාර්ලිමේන්තුවේ සභාගතකර නොතිබුණි. | එකඟ වේ.<br>සමාගමේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාවට විගණන වාර්තාවද ඇතුළත් විය යුතු හෙයින් මේ දක්වා 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර නොමැත. | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළ යුතුය. |

## 4.2 කළමනාකරණ තොරතුරු පද්ධතියේ ඵලදායීතාවය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ව්‍යවසාය සම්පත් සැලසුම්කරණ පද්ධතිය (ERP System) ස්ථාපිත කිරීම සඳහා සමාගම විසින් 2017 වර්ෂයේ සිට රු. 36,514,026 ක පිරිවැයක් හා ආසන්න වශයෙන් රු.1,385,639 ක් වන වාර්ෂික සේවා නඩත්තු පිරිවැයක් දරන ලද නමුත් උක්ත පද්ධතිය සමාගමේ සමස්ත ගිණුම්කරණ ක්‍රියාවලියම ආවරණය වන පරිදි භාවිතයට ගෙන නොතිබුණි. තවද ස්ථාපිතව පවතින පද්ධතීන් ශක්තිමත් පාලනයන්ගෙන් තොරව ක්‍රියාත්මක වීම හේතුවෙන්, දරන ලද උක්ත ස්ථාපනය කිරීමේ පිරිවැය හා වාර්ෂිකව දරනු ලබන නඩත්තු පිරිවැයෙන් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට සමාගම අපොහොසත් වී තිබුණි. | එකඟ නොවේ.<br>අපගේ ආයතනයේ ස්ථාපිත කර ඇති ව්‍යවසාය සම්පත් පරිගණක මෘදුකාංගය 2017 ජනවාරි 01 සිට අප සමාගමේ ක්‍රියාත්මක වන අතර මේ වන විට සියලුම පරිපාලන හා මෙහෙයුම් කටයුතු මෙම පද්ධතිය හරහා සිදු කරනු ලබයි. ඒ අනුව මෙම මෘදුකාංගය ඒකාබද්ධ මෘදුකාංගයක් වශයෙන් සමාගම තුළ ක්‍රියාත්මක වේ. එහිදී ප්‍රසම්පාදන, බෙදාහැරීම, අලෙවි, ආදායම්, ගෙවීම්, වැටුප්, ගිණුම් හා පිරිවැය, කාර්මික, රසායනාගාර හා මානව සම්පත් යන සියලු අංශ ඒකාබද්ධව සියලු කටයුතු සිදු කරනු ලබයි. ව්‍යවසාය සම්පත් මෘදුකාංගය ERP පද්ධති පිළිබඳ ප්‍රමාණවත් පුහුණුවක් සියලුම සේවක හවතුන් සඳහා වසර 04කට වඩා වැඩි කාලයක් ලබා දුන් අතර, දෛනිකව පැන නගින පුහුණු අවශ්‍යතාවයන් තොරතුරු තාක්ෂණ අංශයේ සේවක හවතුන් විසින්ද අඛණ්ඩව මේ දක්වා ලබා දෙනු ලබයි.<br>තවද ව්‍යවසාය සම්පත් මෘදුකාංගය මගින් සිදු කරන කාර්යභාරය පිළිබඳව 2018.07.30 දින පැවති විගණන හා කළමනාකරණ කමිටුව වෙතද ඉදිරිපත් කරන ලද අතර එහිදී එම නිලධාරීන්ගේ පැසසුමට ලක්විය.එසේම අංක 03 ගබඩාව බාහිර විගණකවරුන්ගේ අධීක්ෂණය යටතේ තොග සම්බන්ධ පරිගණක මෙහෙයුම් පරීක්ෂාවට ලක්කර ගබඩාවේ තොග ශේෂයන් ශුන්‍ය වන තෙක් සියලු තොග නිකුත් කර පරිගණක පද්ධතියේ | සමාගමේ සමස්ත ගිණුම්කරණ ක්‍රියාවලියම ආවරණය වන පරිදි පද්ධතිය භාවිතයට ගැනීම සහ ශක්තිමත් අභ්‍යන්තර පාලනයන් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුය. |

තොග ශේෂයන් නිවැරදි බව තහවුරු කරන ලදී.2021/2022 ගිණුම් වර්ෂය සඳහා සියලුම ගබඩාවන්හි තොග සමීක්ෂණ කටයුතු සිදු කිරීමේදී ව්‍යවසාය සම්පත් මෘදුකාංගයෙන් ලබාගත් වාර්තා පදනම් කරගෙන සිදුකළ බව සඳහන් කරමි. ඒ අනුව මෙම ERP පද්ධතිය තුළින් ආයතනය තුළ ඇති සියලුම අංශ හා සමස්ත ක්‍රියාවලිය ආවරණය වන බව සඳහන් කරමි.